**කෑගල්ල ප්‍රාදේශීය සභාව**

**<u>කෑගල්ල දිස්ත්‍රික්කය</u>**

1. මූල්‍ය ප්‍රකාශන

----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 16 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2** තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කෑගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේදී සභාවට ලැබී තිබුණු රු. 1,990,000 ක් වටිනා ට්‍රැක්ටරය හා ටේලරය ගිණුම්ගත නොකිරීම නිසා මෝටර් රථ හා කරත්ත ගිණුම හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ආ) වටිනාකම රු. 426,050 ක් ට්‍රැක්ටරයක් රු. 346,877 ක් ලෙස ගිණුම් ගත කිරීම නිසා මෝටර් රථ හා කරත්ත ගිණුම හා ප්‍රාග්ධනයට ආදායමෙන් දායකවීමේ ගිණුම රු.79,173 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) පළාත්සභා ප්‍රතිපාදන යටතේ වූ කර්මාන්ත 08 කට අදාලව ලැබී තිබුණු සියයට 10 ක රඳවුම් මුදල් රු. 106,276 ක් පොදු තැන්පත් ගිණුමට බැරකර තිබියදී නැවත ණයහිමි හා ණයගැති ගිණුම්වල ඇතුළත් කිරීම හේතුවෙන් ණයහිමි හා ණයගැති ගිණුම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්විණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොලී ආදායම රු. 218,549 කින් අඩුවෙන් දැක්වුණි.

(ඉ) පුස්තකාල පොත් මිලදී ගැනීමේදී ලැබී තිබුණු රු. 40,145 ක වට්ටම් ලැබූ වට්ටම් ගිණුම, වියදම් ගිණුම, පුස්තකාල පොත් ගිණුම හා ප්‍රාග්ධනයට ආදායමෙන් දායකවීමේ ගිණුම්වල එම වටිනාකමෙන් අඩුවෙන් දැක්විණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

------------------------------

ගිණුම් විෂයයන් 06 ට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 64,677,884 වූ නමුත් ඊට අදාල උපයෝගී ලේඛන / වාර්තා අනුව එම ශේෂයන්ගේ එකතුව රු.63,688,839 ක් වූයෙන් වෙනස රු. 989,045 ක් විය.

1.3..3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 කට වඩා පැරණි අයවිය යුතු ශේෂය රු.19,710,965 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 කට වඩා පැරණි ගෙවිය යුතු ශේෂය රු.2,379,495 ක් විය.

1.4 අනුකූල නොවීම්

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1645 (ආ) (ඇ) හා 1646 ප්‍රකාරව සභාවේ වාහන 05 ක වර්ෂ 05 ක කාලයක සිට හා වාහන 02 ක 2017 වර්ෂයට අදාලව ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.22,300,232 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.24,367,221 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,737,340 | 2,893,908 | 2,227,345 | 666,562 | 2,808,140 | 3,203,718 | 2,174,898 | 1,028,820 |
| (ii) | කුලී | 100,800 | 177,282 | 130,205 | 47,077 | 1,017,000 | 1,934,418 | 1,934,418 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 985,000 | 1,034,171 | 1,034,171 | - | 1,372,000 | 1,612,725 | 1,612,725 | - |
| (iv) | වෙනත් ආදායම් | 49,570,000 | 53,716,545 | 29,344,730 | 2,437,180 | 46,100,000 | 56,135,322 | 41,573,985 | 14,561,337 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

---------------------------------------

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් බදු හා වෙනත් ආදායම් පිළිවෙලින් සියයට 19 කින් හා 40 කින් අඩුවී තිබූ අතර කුලී හා බලපත්‍ර ගාස්තු පිළිවෙලින් සියයට 29 කින් හා 05 කින් වැඩිවී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බලප්‍රදේශයේ දියුණු ප්‍රදේශ කලින් කල හඳුනාගෙන නම් කර ඒ අනුව වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවත් පසුගිය වසර 10 ක කාලපරිච්ඡේදය තුල දියුණු ප්‍රදේශ හඳුනා ගැනීමට කටයුතු නොකිරීම නිසා සභාවට ලබාගත හැකිව තිබූ වරිපනම් බදු ආදායම් අහිමි වී තිබුණි

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් රු. 958,115 ක් හා අක්කර බදු රු. 156,989 ක් අතර වර්ෂයකට වැඩි කාලයක සිට පවතින රු. 314,459 ක වරිපනම් බදු හා රු.146,884 ක අක්කර බදු අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නොතිබුණි.

2.2.4 කුලී

-------

කඩ කාමර දෙකක් සඳහා 2012 වර්ෂයට පෙර සිට අයවිය යුතු කුලී රු. 16,140 ක් හා 2013 හා 2015 වර්ෂ සඳහා අයවිය යුතු රු. 80,299 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවියයුතුව තිබුණු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.10,678,923 ක් හා රු.30,217,745 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

-------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පලාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් දෙදෙනෙකුට පමණක් සේවය සැලසෙන මාර්ගයක් කොන්ක්‍රීට් කිරීම සඳහා රු. 291,262 ක් වැයකර තිබුණි.

(ii) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේදී ප්‍රිමික්ස් (පූර්ව මිශ්‍ර) යොදා මාර්ග 21 ක් නඩත්තු කිරීමට රු. 2,835,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද එම කාර්යයන් ඉටුකර නොතිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභා බලප්‍රදේශයේ දිරන කසළ එකතු කිරීම සිදු නොවන අතර කරඩුපන හන්දියේ සිට රඹුක්කන දෙසට පාර අවට හා ඇල ඉවුරට කසළ බැහැර කර තිබුණි. මේ හේතුවෙන් මාර්ගය දෙපස ඉතාමත් අපිරිසිදු පරිසරයක් නිර්මාණය වී තිබුණි.

(ii) ශක්‍යතා අධ්‍යයනයෙන් තොරව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා මිළදී ගෙන තිබුණු මොරොන්තොට හාල්මැස්ස ලුණුගල වත්ත ඉඩමට ප්‍රවේශ මාර්ගයක් හා පාලමක් නොමැති වීම හේතුවෙන් යෝජිත ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී තිබුණු අතර ඉඩම් මිලට ගැනීමට හා අනෙකුත් කටයුතු වෙනුවෙන් සභාව දරන ලද රු. 4,286,322 ක් නිෂ්කාර්ය වියදම් වී තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ

--------------------------------

2016 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව විදුලි උපකරණ රු. 11,413 ක් හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ රු.32,609 ක් වශයෙන් ඌණතාවයන් අනාවරණය වී තිබුණ නමුත් එම ඌණතාවයන් නිරවුල් කර ගැනීමට 2018 අප්‍රේල් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------------

සභාව සතු වටිනාකම රු.426,050 ක් වූ වාහනයක් අවුරුදු 05 ක් හා වටිනාකම රු.625,000 ක් වූ තවත් වාහනයක් අවුරුදු 25 ක් නිෂ්ක්‍රීයව තිබුණද එම වාහන අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

අයවැය පාලනය

---------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන ඇතිකර තිබුණු වැය විෂයන් 07 ක එකතුව රු. 367,000 ක ප්‍රතිපාදන සියයට 100 ක් හා වැය විෂයයන් 15 ක එකතුව රු.7,783,173 ක ප්‍රතිපාදන සියයට 85 ත් සියයට 99 ත් අතර ප්‍රමාණයක් වූ එකතුව රු. 8,150,173 ක් උපයෝජනය කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම් කරණය | (i) | ජනල් සටහන් සඳහා වූ සංලක්ෂ පැහැදිලි නොවීම |
| | | (ii) | උප ලේඛන ගිණුම් සමඟ නොසැසඳීම |
| (ආ) | ආදායම් පරිපාලනය | (i) | හිඟ ආදායම් ආදායම් අයකර ගැනීමට නීතිමය කටයුතු නොකිරීම |
| | | (ii) | වරිපනම් අයකිරීම සඳහා දියුණු ප්‍රදේශ හඳුනා නොගැනීම |
| (ඇ) | අයවැය පාලනය | (i) | ඇස්තමේන්තු ප්‍රතිපාදන වල සැලකිය යුතු ඉතිරිවීම් තිබීම |
| | | (ii) | ඇස්තමේන්තු ආදායම් අයකර නොගැනීම |
| (ඈ) | වත්කම් පාලනය | (i) | දෛනික ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම |
| | | (ii) | වාහනවල ඉන්ධන පරීක්ෂාව සිදු නොකිරීම |
| | | (ii) | සභාව භාවිතා කරන වෙනත් ආයතන සතු වාහන පවරා ගැනීමට කටයුතු නොකිරීම |
| | | (iv) | ඌණ උපයෝජිත වත්කම් පැවතීම |
| | | (v) | ඉඩම් ලේඛනවල තොරතුරු අසම්පූර්ණ වීම |